## ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10

මූලික ගිණුම්කරණ දොෂ ලෙස සැලකිය නොහැකි එකතුව රු.9,846,599 ක් වූ පහත සඳහන් වටිනාකම් පෙර වර්ෂයේ ගැලපීම් ලෙස සලකා වර්ෂයේ ලාභයට ගලපා තිබුණි. මෙලෙස පෙර වර්ෂයට අදාල ගැලපීම් කිරීම සංස්ථාව විසින් සැම වර්ෂයකදීම සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය.

| | රු. |
|---|---|
| නොමිලේ ලැබුණ ඉන්ධන වටිනාකම | 4,828,164 |
| එඬේරමුල්ල නගර සංවර්ධන ව්‍යාපෘතයේ වියදම ලියාහැරීම | (15,653,406) |
| තලවතුගොඩ ව්‍යාපෘතියේ නොනිම් වැඩ ලියාහැරීම | (320,930) |
| විලම්භිත බදු ප්‍රතිපාදනයේ ගණනය කිරීමේ දෝෂයක් නිවැරදි කිරීම | 20,992,771 |
| ශුද්ධ වටිනාකම | 9,846,599 |

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18

වත්කමක ක්ෂය කිරීමේ ප්‍රමාණය එම වත්කමේ ඵලදායී ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් බෙදාහැරිය යුතු වුවද සංස්ථාව කාර්යාල උපකරණ යටතේම පරිගණක හා උපාංග වර්ග කර තිබූ අතර ඒවායේ ක්ෂය අනුපාතය තීරණය කිරීමේදී ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට නොගෙන වෙනත් කාර්යාල උපකරණ ලෙසම 12.5% ක ක්ෂය අනුපාතයකට ක්ෂය කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36

අමාත්‍ය මණ්ඩලය විසින් ඇවර කිරීමට තිරණය කර ඇති සීමාසහිත රිල් එස්ටේට් පුද්ගලික සමාගමේ ආයෝජනය කර තිබූ රුපියල් 2,000,000 සඳහා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුමකට අදාල පොළිය රු.131,506 කින් වැඩියෙන් ගණනය කර තිබීම හේතුවෙන් වර්ෂයේ පොලි ආදායම හා ලැබිය යුතු පොලිය සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පොලී ලැබීම් ලෙස රු.151,999,000ක් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ලද පොලී මුදල රු.138,050,101 ක් පමණක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ බොල් හා අඩමාණ ණය අධිවෙන්කිරීම රු.14,087,220 ක් ලෙස හඳුනාගෙන එම ප්‍රමාණය විකුණුම් වියදම් වලින් අඩුකර තිබූ අතර මෙම වටිනාකම වෙනත් ආදායම් යටතට ගෙන නොතිබුණි.

### 1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

----------------------------------

2011 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ ඒකාබද්ධ ශේෂ පත්‍රයේ තොරතුරු දැක්වෙන තීරුවේ මුළු වත්කම් වල එකතුව රු.7,457,254,000 ක් ලෙස දක්වා තිබූ නමුත් සංස්ථාවේ තොරතුරු පමණක් ඇතුලත් කර තිබූ ශේෂ පත්‍රයේ මුළු වත්කම් වල එකතුව රු.7,538,200,000 ක් ලෙස දක්වා තිබුණි.

## 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සංස්ථාවේ මුළු වෙළඳ ණයගැති ශේෂය රු.175,442,000 ක් වූ අතර එයින් වර්ෂ 02 සිට 05 දක්වා සහ වර්ෂ 5 ට වැඩි කල්ගත වූ හිඟ හිටි ශේෂයන්ගේ එකතුව පිළිවෙලින් රු.23,121,525 හා රු. 47,642,636 ක් විය.

(ආ) ව්‍යාපෘති දෙකකට අදාලව වර්ෂ පහකට පෙර ලබාගත් වැඩ පූර්ව අත්තිකාරම් මුදල වූ රු.3,277,941ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) සංස්ථාව 2011 දෙසැම්බර් 31 දිනට ඉඩම් විකිණිම වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් මුදල රු.535,204,868 ක් වූ අතර එයින් වර්ෂ 4 සිට 5 දක්වා සහ වර්ෂ පහට වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින ශේෂයන් පිළිවෙලින් රු.489,125,647 ක් හා රු.1,038,104 ක් විය.

(ඈ) වෙනත් ණය ගැතියන් යටතේ දක්වා තිබූ රු.4,611,864 ක භාණ්ඩ හා සේවා බදු ශේෂය 2004 වර්ෂයේ සිට පවතන අතර එම ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබූ එක් සමාගමක ණය හිමි වටිනාකම රු.565,200 ද, වෙනත් ණයහිමියකුගේ වටිනාකම රු.2,183,783 ක්ද වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට පවතින අතර එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) වෙනත් අත්තිකාරම් ලැබීම් යටතේ දක්වා ඇති රු.2,299,731 ක යුරෝපා ආර්ථික හවුල නමින් ඇති අත්තිකාරම් මුදල වර්ෂ පහකට වඩා වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) වර්ෂ පහකට වැඩි කාලයක සිට පැවත එන නිරවුල් නොවූ විවිධ ණයහිමි හා උපචිත වියදම් විෂයයන් 07 ක ශේෂයන් තුල බදු වශයෙන් රජයට ගෙවිය යුතු රු.56,913,550 ක් පවතින බව නිරීක්ෂණය විය.

### 1.2.5 නිතී,රිති රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නිති රිති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2010 දෙසැම්බර් 31 දිනැති අංක 2010/26 දරන රාජ්‍ය පර්පාලන චක්‍රලේඛයේ 03 ජේදය | කොන්ත්‍රාත් පදනම මත කාර්යමණ්ඩලය බඳවා ගැනිමේදි මහාභාණ්ඩාගාරයේ කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පුර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පිඊඩි/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| (i) 9.7 වගන්තිය | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා නිලධාරින් සඳහා වැටුප් හෝ දීමනා අනුමත බඳවා ගැනිම් පර්පාටිය අනුව තීරණය කල යුතු වුවත් නිලධාරින් 06 දෙනෙකු වෙනුවෙන් චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන රු.40,000 සිට 140,000 දක්වා පරාසයක දීමනා ගෙවා තිබුණි. කෙසේ වෙතත් සංස්ථාවේ ඉහල මට්ටමේ ඇති වු හදිසි පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාව අනුව බොහෝවිට විදේශ ආධාර ව්‍යාපෘතිවලට අදාලව මෙම බඳවා ගැනීම කළ බව සභාපතිවරයා දන්වා ඇත. |
| (ii) 9.3.1(1) වගන්තිය | ආයතනයේ බඳවා ගැනිමේ හා උසස්විමේ පර්පාටිය පිළියෙල කර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය සහ අදාල අමාත්‍යංශය විසින් අනුමත කල යුතු වුවත් සංස්ථාවට අදාලව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදය | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේදී රු.35,270,383ක දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4වගන්තිය | විධිමත් ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය නොකර ෆැක්ස් මගින් ලබාගත් මිල කියුම් මත රු.14,235,965 ක් වටිනා ටෙන්ඩරයක් පිරිනමා තිබුණි. |

### 1.2.6 මතභේදයට තුඩුදෙන කරුණු

පහත නිරීක්ෂණයන් කෙරේ.

සංස්ථාවට අයත් ඉඩමක නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා රු.489,000,000 ක අත්තිකාරම් මුදලක් ආයෝජකයකුගෙන් ලබාගෙන දෙපාර්ශවය සමඟ 2007 ජුනි 27 දින ගිවිසුම් අත්සන් කර තිබුණද වසර 05 කට ආසන්න කාලයක් ගත වී ඇතත් කිසිදු සංවර්ධනයක් සිදුවී නොතිබුණි. ගිවිසුම් ප්‍රකාරව ආයෝජක මෙන්ම සංස්ථාවද කටයුතු කර නොතිබුණු අතර ආයෝජකයා ඉඩම ආපසු ලබාදුනහොත් ගිවිසුම ප්‍රකාරව දින 14 ක් ඇතුලත ඉහත මුදල ගෙවීමට සිදුවන හෙයින් කාරක ප්‍රාග්ධන ගැටළු මතුවිය හැකි බව නිරීක්ෂණය වන අතර ගිවිසුම යාවත්කාලීන කිරීමට හෝ විශාල වාණිජමය අගයක් ඇති මෙම භූමිය වෙනත් ආයෝජකයකුට හෝ ලබා දී එහි ප්‍රතිලාභ සංස්ථාවට මෙන්ම සමාජයට ලබාගැනීම කෙරෙහි සංස්ථාවේ අවධානය යොමුවී නොමැති බව නිරීක්ෂණය කෙරේ. ආයෝජන මණ්ඩලයේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදුකරන බව සභාපතිවරයා දැනුම් දී ඇත.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව,සමාලෝචිත වර්ෂය සඳහා ව සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු අයකිරීමට පෙර රු.398,656,336 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.135,580,563 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.263,075,773 ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

පෙර වර්ෂයේ මුහුදුවැලි අලෙවි ආදායම වූ රු.683,437,366 හා සැසඳීමේදී ප්‍රවර්තන වර්ෂයේදී එම ආදායම රු.1,793,419,487 දක්වා 162.41%කින් වැඩිවීම සමස්ථ මූල්‍ය ප්‍රතිඵලය වර්ධනයට බෙහෙවින් බලපා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්ය සාධනය**

-------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) භාණ්ඩාගාර ප්‍රතිපාදන මත කර ගෙන යනු ලබන ව්‍යාපෘති

(i) තලවතුගොඩ ඇල හැරීමේ ව්‍යාපෘතිය 2011 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කලද එදිනට එම ව්‍යාපෘතියේ ප්‍රගතිය ප්‍රගති වාර්තා අනුව 12% වැනි අවම මට්ටමක පැවති අතර මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 206.3 හා සැසඳිමේදී ශේෂ පත්‍ර දිනට රුපියල් මිලියන 24.56 ක් පමණක් වැයකර තිබුණි.

(ii) එපිටමුල්ල ඇල හැරීමේ ව්‍යාපෘතිය අත්හිටුවා ඇති අතර ප්‍රගති වාර්තා අනුව එහි ප්‍රගතිය 2011 දෙසැම්බර් 31 දිනට 3%ක වැනි අවම මට්ටමක පැවතුණ අතර එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 7.77 හා සැසඳීමේදී රුපියල් මිලියන 0.21 ක් පමණක් වැය වී තිබුණි.

(iii) රම්පාලවත්ත ජලය බැස යාම සඳහා සොරොව් (Sluice) 02 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය 6% ක් වූ අතර එම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 13.70 හා සැසඳිමේදී එදිනට එම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 0.82 ක් පමණක් වැයකර තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට පිළියෙල කල ප්‍රගති වාර්තාවලට අනුව සංස්ථාවේ ප්‍රධාන කාර්යයක් වූ ඉඩම් නිරාකරණ කටයුතු වෙනුවෙන් අනුමැතිය ලබාදීම සඳහා 2011 වර්ෂයේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 33 ක් වුවද 2011 දෙසැම්බර් 31 දිනට වැයකර ඇති මුදල රුපියල් මිලියන 8.94 ක් පමණක් විය. ඒ අනුව එහි මූල්‍ය ප්‍රගතිය 8% ක් හා භෞතික ප්‍රගතිය 27% ක් වැනි අවම මට්ටමක පැවතුණි. කෙසේ වෙතත් පහත් බිම් පිරවීම සම්බන්ධයෙන් ඇති වූ සීමාකිරීම නිසා මෙම තත්වය ඇති වූ බව සභාපතිවරයා දනවා ඇත.

## 3.2 කලමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පරවාගත් ඉඩම් අත්පත් කර ගැනීමේදි සැලකිය යුතු කාල පමාවන් සිදුවී තිබීම හේතුවෙන් ඒ සඳහා පොලි වශයෙන් රු.232,279,614 කට ආසන්න මුදලක් බාහිර පාර්ශවයන් වෙත ගෙවීමට සිදුවීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය වන අතර අදාල වන්දි ගෙවීමේ කාර්ය කඩිනම් කර පොලි ගෙවීම අවම කර ගත හැකි අයුරින් ප්‍රාදේශිය ලේකම් කාර්යාල සමග ප්‍රමාණවත් සම්බන්ධිකරණයක් පවත්වා නොමැති වීම නිසා මෙවැනි තත්වයක් මතුවී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් කඩිනම් ප්‍රතචාර නොලැබීම මෙම තත්වයට හේතු වු බව සභාපතිවරයා දනවා ඇත.

(ආ) සංස්ථාව විසින් මුදුන් ඇල අවට අක්කර 151 ක් පමණ අත්පත් කරගෙන තිබු අතර මෙම ඉඩම අත්පත් කර ගැනීම වෙනුවෙන් මේ වන විට වන්දි මුදල් හා පොලී වශයෙන් රු.45,462,719 ක මුදලක් ගෙවා තිබුණු අතර තවදුරටත් රු.113,223,362 ක මුදලක් වන්දි වශයෙන් හා රු.134,525,935 ක් පොලි වශයෙන් ගෙවිය යුතු වේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ .

(i) ඉහත සඳහන් ප්‍රදේශයේ ඇලමාර්ග හා වගුරුබිම් ක්‍රමානුකූලව හා ඉතා ඉක්මනින් සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම ඉඩම අත්පත් කර තිබණද දැනට සංවර්ධනය කර ඇති බිම් ප්‍රමාණය දල වශයෙන් අක්කර 19 රූඩ් 1 පර්චස් 35 ක් පමණ බව නරීක්ෂණය විය. කෙසේ වෙතත් කොළඹ කටුනායක අධිවේගි මාර්ගය නිසා ඇති වන තත්වයන්ට ගැලපෙන පරිදි නව සැලැස්මකට අනුව කටයුතු කළ නිසා අදාල සංවර්ධන කටයුතු ප්‍රමාද වී ඇති බව සභාපතිවරයා දක්වා ඇත.

(ii) එලෙස සංවර්ධනය කරන ලද භූමියේ අක්කර 3 1/2 ක පමණ ප්‍රදේශයක කෝවිලක් විධිමත් අනුමැතියකින් තොරව ඉදිකර ඇති බව අනාවරණය විය. එම ඉඩම සංවර්ධනය සඳහා සංස්ථාව අවම වශයෙන් රුපියල් මිලියන 30.2 ක් පමණ මුදලක් වැයකර ඇති අතර එම මුදල කෝවිල ඉදිකල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ ඉඩම නැවත අත්පත් කර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(iii) මෙම ඉඩම අත්පත් කර ගැනීමට පෙර සංවර්ධන සැලැස්මක් පිලියෙල කර අනුමත කර ගත යුතු වුවත් එලෙස අනුමැතිය ලබාගෙන නොතිබුණි. මේ අනුව සාමාන්‍ය පර්පාටියෙන් බැහැරව පනතේ 38(අ) අතුරු විධානය යටතේ ඉඩම් අත්පත් කර ගැනීම තුලින් අපේක්ෂිත කඩිනම් සංවර්ධනයක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) මුහුදු වැලි නිෂ්පාදනය සඳහා 2005 වර්ෂයේදි විදේශික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණ අතර එම විදේශික කොන්ත්‍රාත්කරුට ඒ සඳහා ව යන්ත්‍රෝපකරණ තිරුබදු රහිතව බැංකු ඇපකරයක සුරක්ෂිතතාවය මත ආනයනය කිරීමට ශ ලංකා රේගුව විසින් අවසර ලබා දි තිබුණි.ව්‍යාපෘතිය අවසානයේ එම උපකරණ ප්‍රතිඅපනයනය කිරීමට හෝ අදාල බදු ගෙවා ශ්‍රී ලංකාව තුල අලෙවි කිරීම කල යුතුව තිබුණි. ව්‍යාපෘතිය අවසානයේදි සංස්ථාව විසින් ලබා දුන් සාමුහික බැංකු ඇපකරයක් (Corporate gurantee) මත කොන්ත්‍රාත්කරුට සිය බැංකු ඇපකරය නිදහස් කර ගැනීමට අවස්ථාව සලසා ද තිබුණි. කෙසේ වෙතත් අදාල යන්ත්‍රෝපකරණ තොගය ප්‍රති අපනයනය කල බව තහවරු කිරීමට සංස්ථාව අපොහොසත් වුයෙන් අදාල කොන්ත්‍රාත්කරු විසින් ගෙවීම පැහැර හැර ඇති රු.4,096,000 ක රේගු බදු ගෙවීමේ වගකීම සංස්ථාව වෙත පවරා ඇති බව නිරීක්ෂණය විය. නීතිපති උපදෙස් ලැබෙන තුරු මේ සම්බන්ධ අවසාන තීරණයකට එළඹීමට සංස්ථාවට නොහැකි වී ඇති බව සභාපති දන්වා ඇත.

## 3.3 ආර්ථික නොවු ගණුදෙනු

-----------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සංස්ථාව විසින් රු.39,408,404 ක වියදමක් දරමින් ක්‍රියාත්මක කළ පහත සඳහන් ව්‍යාපෘති අතරමග නවතාදමා තිබීම හේතුවෙන් එම ව්‍යාපෘති සඳහා දරන ලද වියදමින් කිසිදු ප්‍රාර්ශවයකට නිසිඵල ලැබී නොතිබුණි.

| ව්‍යාපෘතිය | වියදම<br>රු. |
|---|---|
| බේරේ වැව හැරීමේ ව්‍යාපෘතිය | 11,317,985 |
| බණ්ඩාරවෙල නගර මධ්‍ය ව්‍යාපෘතිය කැබලි අංක 2 | 3,455,809 |
| බණ්ඩාරවෙල නගර මධ්‍ය ව්‍යාපෘතිය කැබලි අංක 4 | 3,229,457 |
| නුවරඑළිය ඉහල උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 21,405,153 |
| | 39,408,404 |

(ආ) එඩේරමුල්ල හා තලවතුගොඩ ව්‍යාපෘති වල පිරිවැය වූ පිළිවෙලින් රු.15,653,406 ක් හා රු.320,930ක් සමාලෝචිත වර්ෂය තුලදී ලියාහැර තිබුණි.

(ඇ) 1996 වර්ෂයේ සිට පුද්ගලික සමාගමක රු.1,000,000 ක් ආයෝජනය කර තිබූ අතර ආයෝජනය කරන ලද මුළු මුදල සඳහාම වටිනාකම අඩුවීම වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා තිබුණි. තවද ආයෝජන දින සිට මේ දක්වා කිසිදු ආයෝජන ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි.

(ඈ) 1998 දි සීමාසහිත රිල් එස්ටේට් පුද්ගලික සමාගමේ රුපියල් මිලියන 2 ක් ආයෝජනය කර තිබූ අතර ඒ සඳහා සංස්ථාවට කසිදු දිනෙක ලාභාංශ ලැබී නොතිබණි. මේ අවස්ථාව වන විට මෙම සමාගම ඈවර කිරීමට තීරණය කර ඇති නමුත් ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි.

### 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

2011 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1339 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 1177ක් වුයෙන් සේවක මණ්ඩලයේ තනතුරු 162 ක පුරප්පාඩු ඇති වී තිබුණි. ඒවා පිරවීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි. මෙම පුරප්පාඩු වලින් ආයතනයේ ඉහළ කළමනාකරණයේ පුරප්පාඩු 20 ක් තිබූ අතර එය ආයතනයේ කාර්යක්ෂමතාව කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. කෙසේ වෙතත් මෙම පුරප්පාඩු බොහොමයක් පිරවීමට කටයුතු යොදා ඇති බව සභාපතිවරයා දන්වා ඇත.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 ක්‍රියාකාර් සැලැස්ම

ආයතනයේ අරමුණ හා ඉලක්ක ළඟාකර ගැනීමට ඉටුකල යුතු කාර්යයන් කවරේද යන්න පිළිබඳව නිශ්චිතව හඳුනාගෙන ක්‍රියාකාර් සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර ක්‍රියාකාර් සැලැස්ම කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි. ක්‍රියාකාර් සැලැස්ම සංයුක්ත සැලැස්ම හා වාර්ෂික අයවැය සමඟ සමගාමී නොවන අතර ආයතනික ක්‍රියාකාර් සැලැස්ම ප්‍රගති වාර්තා සමඟ නිශ්චිතව සැසඳීම අසීරු අතර සැලකිය යුතු විචලනයන්ද නිරීක්ෂණය විය.

## 4.2 ප්‍රසම්පාදන සැලැස්ම

සංස්ථාව විසින් 2011 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීම

(ආ) ගනුදෙනුකරුවන්ගෙන් අත්තිකාරම් ලබා ගැනීම

(ඇ) එකිනෙක අංශවල තොරතුරුවල සම්බන්ධීකරණය

(ඈ) වැලි තොග ගණනය කිරීම

(ඉ) ගිණුම්කරණය